තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

# ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය 1979 වසරේ සිට ක්‍රීඩා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පාඨමාලා පවත්වනු ලබන ප්‍රමුඛ ආයතනය වේ.

## ක්‍රීඩා අධ්‍යාපන පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවීම - 2026

### පුහුණුකරු උසස් පාඨමාලාව - දැල්පන්දු (NVQ 06)

ක්‍රීඩා ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති දැල්පන්දු පුහුණුකරුවන් සඳහා නවීන තාක්ෂණික දැනුම ලබාදීමේ අරමුණින් මෙම පාඨමාලාව පැවැත්වේ.

පාඨමාලා කාලය : වසර 01කි. ( මුල් මාස 6 තුල සෑම සතියේ දිනකම පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලා කාලයක් අන්තර්ගත වන අතර ඉතිරි මාස 6 පර්යේෂණ කාලයකින් සමන්විත වේ.)

පාඨමාලා මාධ්‍ය : සිංහල සහ ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තු : රු. 50,000.00

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

1. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතන ක්‍රීඩා ඩිප්ලෝමාව සමත් වීම සහ දැල්පන්දු ක්‍රීඩාවේ පුහුණුකරුවෙකු වීම.

   හෝ

2. වසර 03ක (අධ්‍යාපන විද්‍යා පීඨ) ශාරීරික අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම සහ දැල්පන්දු පුහුණුකරුවෙකු වීම.

   හෝ

3. ජාතික ක්‍රීඩා සම්මේලනය මඟින් පවත්වනු ලබන පාඨමාලාවක් සාර්ථකව නිමකොට පුහුණුකරු බලපත්‍රයක් ලබා තිබීම සහ ජාතික මහා ක්‍රීඩා උළෙල් පළාත් මට්ටමේ තරඟයක හෝ ජාතික පාසල් තරඟ ජයග්‍රහණය කල කණ්ඩායමක පුහුණුකරුවකු වීම.

**මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය - 2026.04.30**

***වැඩිදුර තොරතුරු : පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 236***

### ශාරීරික යෝග්‍යතා උපදේශක පාඨමාලාව - (NVQ 04)

ශ්‍රී ලාංකික ජනතාව අතර උද්ගත වී ඇති බෝනොවන රෝග පාලනය කිරීම පිණිස ව්‍යායාම කිරීම සඳහා නිවැරදි උපදෙස් ලබාදිය හැකි විද්‍යාත්මක දැනුම හා ප්‍රායෝගික කුසලතා සහිත ශාරීරික යෝග්‍යතා උපදේශකයින් පුහුණු කිරීමේ අරමුණින් මෙම පාඨමාලාව පැවැත්වේ.

**මෙම පාඨමාලාව ජාතික වෘත්තීය සුදුසුකම් 04 මට්ටමට (NVQ - 04) අනුකූලව පවත්වනු ලබන අතර පාඨමාලාව හැදෑරීම තුලින් ව්‍යායාම් මධ්‍යස්ථානයක ශාරීරික යෝග්‍යතා උපදේශකවරයකු ලෙස සිය වෘත්තීය කටයුතු ආරම්භ කිරීමට හැකිවේ .**

පාඨමාලා කාලය : වසර 01 කි. (සෙනසුරාදා හෝ ඉරිදා දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

පාඨමාලා මාධ්‍ය : සිංහල සහ ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තු : රු. 30,000 .00

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :** අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටීම සහ ක්‍රීඩා පසුබිමක් තිබීම.

**මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය - 2026.04.30**

***වැඩිදුර තොරතුරු : පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 234***

### ක්‍රීඩා සම්බාහන සහතික පත්‍ර පාඨමාලාව - (NVQ 04)

ක්‍රීඩා පුහුණුකරුවන් සහ අනෙකුත් ක්‍රීඩා වෘත්තිකයින් සඳහා ක්‍රීඩා විද්‍යාව හා ක්‍රීඩා සම්බාහනය පිළිබඳ මූලික දැනුම ලබාදීම අරමුණු කර ගනිමින් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය විසින් ක්‍රීඩා සම්බාහන සහතික පත්‍ර පාඨමාලාව පවත්වනු ලබන අතර මෙය ජාතික වෘත්තීය සුදුසුකම් 04 මට්ටමේ පාඨමාලාවකි.

පාඨමාලා කාලය : වසර 01කි. ( මුල් මාස 06 තුල සති අන්ත දින වලදී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00දක්වා න්‍යායාත්මක දේශන හා ප්‍රායෝගික පුහුණුව ඇතුලත් පාඨමාලා කාලයකින් සමන්විත වන අතර තවත් මාස 06ක ආයතනික පුහුණු කාලයකින් සමන්විත වේ.)

පාඨමාලා ගාස්තු : රු. 75,000.00 (වාරික තුනකින් ගෙවිය හැකිය)

පාඨමාලා මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටීම සහ ක්‍රීඩා පුහුණුකරුවෙක් හෝ ශාරීරික යෝග්‍යතා උපදේශකවරයෙක් ලෙස සේවා පළපුරුද්දක් තිබීම.

**මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය - 2026.07.31**

**වැඩිදුර තොරතුරු: පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 232**

### ස්වායු යෝග්‍යතා උපදේශක පාඨමාලාව - (NVQ 04)

වෘත්තිය මට්ටමේ ස්වායු ව්‍යායාම උපදේශකයින් සඳහා දැනුම ලබාදෙන අතර ශාරීරික යෝග්‍යතාවය හා විනෝදාස්වාදය සඳහා ව්‍යායාම කිරීම මෙන්ම, වර්තමානයේ බහුලව දක්නට ලැබෙන බෝනොවන රෝග පාලනය කිරීම සඳහා ව්‍යායාම වැඩසටහන් සකස් කිරීමට අවශ්‍ය කුසලතාව වර්ධනය කිරීම මෙම පාඨමාලාවේ අරමුණ වේ.

පාඨමාලා කාලය : වසර 01 (මුල් මාස 06 සිකුරාදා සහ සෙනසුරාදා දින වලදී පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ඇතුලත් වේ. ඉතිරි මාස 06 රැකියාගත පුහුණු කාලයකින් සමන්විත වේ.)

පාඨමාලා ගාස්තු : රු. 40,000.00 (වාරික දෙකකින් ගෙවිය යුතුය)

පාඨමාලා මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :** අ.පො.සා. පෙළ භාෂාව (සිංහල/දෙමළ) හා ගණිතය සමත්වීම සහ ක්‍රීඩා පසුබිමක් තිබීම.

**මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය - 2026.04.30**

***වැඩිදුර තොරතුරු : පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 204***

### ක්‍රීඩා විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - අදියර I

වෘත්තීයමය ක්‍රීඩා පුහුණුකරුවකු ලෙස සාර්ථකත්වය වෙත ළඟාවීමට අපේක්ෂා කරන පුහුණුකරුවන්ට (ආයතනගත හා ස්වේච්ඡා පුහුණුකරුවන්) ක්‍රීඩාවට අදාල නූතන තාක්ෂණික දැනුම ලබාදීමේ අරමුණින් මෙම පාඨමාලාව පැවැත්වෙන අතර **පිහිණුම්, මලල ක්‍රීඩා, එල්ලේ සහ අත්පන්දු (Handball)** යන ක්‍රීඩාවන්ට අදාල පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවේ.

පාඨමාලා කාලය : සති 06 (පැය 72කි. සතියට දින 02 බැගින් පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

පාඨමාලා මාධ්‍ය : සිංහල සහ ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තු : රු. 10,000.00

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

1. විවෘත මට්ටමේ නම්, දිස්ත්‍රික් ප්‍රථම, දෙවන හෝ පළාත්, ජාතික තරඟයක නම්, ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හෝ කණ්ඩායම් පුහුණුකර තිබීම,

   හෝ

2. පාසල් මට්ටමේ නම්, කලාප ප්‍රථම, දෙවන හෝ පළාත්, ජාතික තරඟයක නම් ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හෝ කණ්ඩායම් පුහුණුකර තිබීම.

   හෝ

3. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතන විසින් පිරිනමන ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

**මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය - 2026.02.27**

**වැඩිදුර තොරතුරු: පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 236**

### පුහුණුකරු කුසලතා සංවර්ධන පාඨමාලාව

ශ්‍රී ලංකාවේ පුහුණුකරුවන්ගේ ක්‍රීඩා දැනුම සහ කුසලතා සංවර්ධනය කිරීම සඳහා මෙම පාඨමාලාව පවත්වනු ලබන අතර සියළුම ක්‍රීඩා සඳහා වන පාඨමාලාවන්ට අයදුම්පත් කැඳවනු ලැබේ.

**මෙම පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කරන පුහුණුකරුවන් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ලියාපදිංචි කර "පුහුණුකරු ලියාපදිංචි සහතිකය" නිකුත් කිරීමටද කටයුතු කරනු ලැබේ.**

පාඨමාලා කාලය : මාස 03 (සතියකට එක් දිනයක් බැගින් පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

පාඨමාලා ගාස්තු : රු. 8,000 .00

පාඨමාලා මාධ්‍ය : සිංහල සහ ඉංග්‍රීසි

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

1. පුහුණුකරුවෙක් ලෙස වසර 03ක පළපුරුද්ද
2. ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රහණ අත්කරගත් ක්‍රීඩකයින් පුහුණුකර තිබීම.

**මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය - 2026.04.30**

**වැඩිදුර තොරතුරු : පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 241**

### ක්‍රීඩා ආබාධ කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාව

ක්‍රීඩකයින් ක්‍රීඩා ආබාධ වලින් වලක්වා ගැනීම සහ ක්‍රීඩා ආබාධ කළමනාකරණය පිළිබඳ මූලික දැනුම ලබාදීමේ අරමුණින් ක්‍රීඩා පුහුණුකරුවන් හා ශාරීරික යෝග්‍යතා උපදේශකවරුන් ඉලක්ක කර ගනිමින් මෙම පාඨමාලාව පවත්වනු ලබයි.

පාඨමාලා කාලය : පැය 102 (සිකුරාදා සහ සෙනසුරාදා පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

පාඨමාලා මාධ්‍ය : සිංහල සහ ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තු : රු. 20,000.00

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :** ක්‍රීඩා පුහුණුකරුවෙක් හෝ ශාරීරික යෝග්‍යතා උපදේශකවරයෙක් ලෙස සේවා පළපුරුද්දක් තිබීම.

**මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය - 2026.02.27**

**වැඩිදුර තොරතුරු : පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 232**

### ක්‍රීඩා මනෝවිද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

ක්‍රීඩා දක්ෂතා ඔප්නංවමින් ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා ජයග්‍රහණ අත්පත් කර ගැනීමට අවශ්‍ය මනෝවිද්‍යාත්මක සහාය සහ දැනුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් මෙන්ම ඔවුන්ට සම්බන්ධිත සියළුම පාර්ශවයන් වෙත ලබාදීම මෙම පාඨමාලාවේ අරමුණ වේ. එනම්, ක්‍රීඩක ක්‍රීඩිකාවන්, ක්‍රීඩා පුහුණුකරුවන්, ගුරුවරුන්, දෙමාපියන් සහ මේ පිළිබඳව උනන්දුවක් දක්වන සියළුම පාර්ශවයන්ට මෙම පාඨමාලාව සඳහා සහභාගී විය හැකි අතර ඒ සඳහා පහත සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.

පාඨමාලා කාලය : පැය 102 ( ඉරිදා / සෙනසුරාදා )

පාඨමාලා ගාස්තු : රු. 20,000.00

පාඨමාලා මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :** අ.පො.සා. පෙළ විභාගය සමත්වීම සහ ක්‍රීඩා පසුබිමක් තිබීම.

**මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය - 2026.02.27**

***වැඩිදුර තොරතුරු : පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 232***

### අයදුම්පත් එවියයුතු ආකාරය

- සියළුම පාඨමාලා සඳහා අයදුම්පත් සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව.4.00 දක්වා ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය වෙත පැමිණ හෝ Niss Srilanka යන ෆේස්බුක් පිටුව මඟින් හෝ පහත QR කේතය භාවිතා කර ලබාගත හැක.
- සම්පූර්ණ කරන ලද අයදුම්පත් එක් එක් පාඨමාලාවන්හි දක්වා ඇති අයදුම්පත් භාරගැනීමේ අවසාන දින හෝ ඊට පෙර, **අධ්‍යක්ෂ**, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, 100/7, නිදහස් මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- **සැයු : ඔබ විසින් පාඨමාලා කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම් ඒ සඳහා වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කල යුතු අතර අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහල කෙළවරේ අයදුම්කරන පාඨමාලාව කුමක්ද යන්න සඳහන් කළ යුතුය.**

**අයදුම්පත්‍ර බාගත කර ගැනීම සඳහා පහත QR කේතය (QR Code) ස්කෑන් (Scan) කරන්න.**

අධ්‍යක්ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, 100/7, නිදහස් මාවත, කොළඹ 07. දුරකථන : 011 2684921 ෆැක්ස් : 011 2667709